# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,752 — 1961 නොවැම්බර් 11 වැනි සෙනසුරාද — 11.11.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 64/61 (8).

**1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගයන්හි 23 වෙනි නියෝගයෙහි (5) වෙනි ඡෙදය යටතේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් පනවනු ලබන ව්‍යවස්ථා.

ඕ. ඊ. ගුණතිලක,
අග්‍රාණ්ඩුකාරවරයා.

1961 නොවැම්බර 11 වැනිද,
කොළඹ,
අග්‍රාණ්ඩුකාරවරයාගේ කාර්‍යාලය.

### ව්‍යවස්ථා

1. 1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගයන්හි 23 වෙනි නියෝගයෙහි (1) වෙනි ඡෙදය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් යම් තැනැත්තකු සම්බන්ධයෙන් ආඥාවක් කරනු ලැබ, එය ක්‍රියාවේ යොදනු ලැබූ අවස්ථාවක, ඒ නියෝගයෙහි කාර්යයන් සඳහා පත් කරනු ලැබූ යම් උපදේශක කාරක සභාවක සැලකිල්ල සඳහා ඒ ආඥාවට විරුද්ධ ව ලිඛිත විරුද්ධතාවන් ඒ ආඥාව ක්‍රියාවේ යොදනු ලැබූ දවසින් පසු 20 දවසක් ඇතුළත ඉදිරිපත් කළ හැකි ය.

2. 1 වෙනි ව්‍යවස්ථාවේ සඳහන් කරනු ලැබූ ලිඛිත විරුද්ධතාවන් අග්‍රාණ්ඩුකාරවරයාගේ ලේකම්ගේ කාර්‍යාලයට ලියාපදිංචි කළ තැපැලෙන් හෝ භාර දීමෙන් හෝ එවිය හැකිය.

3. උපදේශක කාරක සභාවක සැලකිල්ල සඳහා යම් විරුද්ධතාවන් ඉදිරිපත් කරන හැම තැනැත්තකුට ම, ඒ කාරක සභාව විසින් ඔහුගේ විරුද්ධතාවන් සැලකිල්ලට භාජන කරනු ලබන අවස්ථාවෙහි, ඒ කාරක සභාව ඉදිරියෙහි පුද්ගලිකව පෙනී සිටීමට හෝ අධිනීතිඥයකු, නීතිඥයකු හෝ එවැනි තැනැත්තකු විසින් නිසියාකාර බලය පවරනු ලැබූ වෙනත් නියෝජිතයකු විසින් නියෝජනය කරනු ලැබීමට හිමිකම් තිබිය යුතු ය.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2019—ජේ. ඇන්. ආර්. 20194—6,400 (11/61)